**බැංකු පනත් නියෝගය 2018 අංක 02** 2018 නොවැම්බර් 30

## බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගය

1988 අක 30 දරන සංශෝධිත බැංකු පනතේ 23, 25 සහ 26 යන වගන්තීන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව නිකුත් කරන ලද නියෝගය.

1. මෙම නියෝගය 2018 අංක 02 දරන බැංකු පනත් නියෝගය වේ.

2. බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) පිළිබඳව 2000 අප්‍රේල් මස 7 වන දිනැති නියෝගයෙහි 2(2) සහ 4(3) යන වගන්තීන් අවසන් වූ වහා පහත වගන්තීන් අනුපිළිවෙලින් ඇතුළත් විය යුතුය.

| | | | |
|---|---|---|---|
| 2.1 | බලයලත් ව්‍යාපාර කටයුතු | 2(3) | බැංකු පනතේ 25(ආ) වගන්තිය යටතේ සිදු කරනු ලබන විදේශ විනිමය ණයගැනීම්, බලපත්‍රලාභී බැංකු මගින් සිදු කරන විදේශ විනිමය ණයගැනීම් පිළිබඳව 2018 නොවැම්බර් මස 30 දිනැති 2018 අංක 11 දරන බැංකු පනතේ විධානයන්හි ඇතුළත් කොන්දේසි සහ නියමයන්ට යටත්ව සිදු කළ යුතුය. |
| 2.2 | නේවාසිකයින් සමඟ සිදු කළ හැකි බලයලත් ව්‍යාපාර කටයුතු | 4(4) | බලපත්‍රලාභී බැංකු මගින් සිදු කරන විදේශ විනිමය ණයගැනීම් පිළිබඳව 2018 නොවැම්බර් මස 30 දිනැති 2018 අංක 11 දරන බැංකු පනත් විධානයන්හි ඇතුළත් කොන්දේසි සහ නියමයන්ට යටත්ව, අක්වෙරළ ඒකකයක් විසින් 4(1) වගන්තියෙහි සඳහන් නේවාසිකයින් සමඟ ණය ගැනීම් කටයුතුවල නිරත විය හැකිය. |

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**